# 13th International Conference on Pali and Buddhist Studies (ICPBS-2017)

# PROCEEDINGS

Department of Pali and Buddhist Studies
Faculty of Humanities and Social Sciences
University of Sri Jayawardenepura

# ශ්‍රී ලංකාවේ ආගමික ගැටුම් නිරාකරණය, සාමය ගොඩනැගීම සඳහා බෞද්ධ ආගමික හා දේශපාලන නායකත්වයේ කාර්යභාරය පිළිබඳ අධ්‍යයනයක්

එච්. ඒ. එන්. ප්‍රියදර්ශනී[1]

## හැඳින්වීම

ආගම යනු වර්තමාන ලෝකය තුළ බොහෝ පර්යේෂකයන් හා සාමාන්‍ය ජනයා අතර නිරන්තර කතාබහට පාත්‍ර වන්නා වූ මාතෘකාවක් ලෙසට දැක්විය හැක. එමෙන්ම ආගම් හා දර්ශනයන් ලොවට ජනිත වී ඇත්තේ මිනිසුන්ගේ යහපැවැත්ම උදෙසාය. මිනිසා මනුෂ්‍යකමින් පරිපූර්ණ කිරීම සඳහාය. යම් ආගමකට හෝ දර්ශනයකට නතු වූ සිටින්නා වූ පුද්ගලයා තම ආගම දර්ශනය වෙනුවෙන් හඩ නැගීම, ගැටුම් ඇති කරගැනීම වර්තමාන ලෝකයේ නිදසුන් ඇසුරින් සාකච්ඡා කළ හැකි මාතෘකාවකි. මෙවැනි පුද්ගලයන් අර්බුදකාරී වාතාවරණයන්ට මැදිහත් වන්නේ තම ආගමේ හෝ දර්ශනයේ පවත්නා ප්‍රධාන පරමාර්ථයවත් නොදැනය. නැතහොත් තම ආගමේ දර්ශනයේ පවත්නා සහනශීලීත්වය, සංහිඳියාව වැනි වැදගත් ඉගැන්වීම් බැහැරකරමින්ය. බෞද්ධ දර්ශනය ද යනු එවැනි ආගමික සහනශීලිත්වයක්, එකිනෙකා වෙනුවෙන් සංවේදීවෙමින් මානුෂිකත්වයේ උපරිමයට ගිය ආගමක් ලෙස දැක්විය හැක. නමුත් වර්තමාන ශ්‍රී ලාංකික සමාජ

1. කථිකාචාර්ය, දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, nilupriyadarshani120@gmail.com

දේශපාලන හා ආගමික වාතාවරණය දෙස බලන විට පෙනීයන ප්‍රධාන කරුණක් වන්නේ ආගමික සහනශීලීත්වයෙන් ඔබ්බට ගොස් එකිනෙකා කෙරෙහි ආරවුල් ඇතිකරගනිමින් සාමයට හානි පමුණුවන ආකාරයේ ක්‍රියාවන් සිදුවීමය. මෙම ගැටුම්කාරී තත්ත්වය සංසිඳුවීම සඳහා දේශපාලන නායකත්වයට මෙන්ම බෞද්ධ ආගමික නායකයත්වය විෂයෙහි ඉතා ගැඹුරු කාර්යභාරයක් පැවරී ඇත. විශේෂයෙන් බුදුදහම තුළ ඉගැන්වෙන මූලික සංකල්පයන් වන සමානාත්මතාවය, අන්‍යයන් කෙරෙහි ගෞරව කිරීම, සහජීවනය හා සංහිඳියාව වැනි වැදගත් සංකල්පයන් උපයෝගී කරගනිමින් සමාජය නිසි මගට යොමුකිරීමෙහි ලා ප්‍රධාන කාර්යභාරය පැවරී ඇත්තේ බෞද්ධ ආගමික නායකත්වය කෙරෙහිය. නමුත් වර්තමාන ලංකාවේ ගැටුම් චර්යාවන් දෙස බැලීමේදී මැනවින් විදහා දක්වනු ලබන කරුණක් වන්නේ බෞද්ධ ආගමික නායකත්වයේ මෙම කාර්යභාරය පසුගාමී ස්වරූපයක් ගන්නා බවයි. මීට අමතරව ගැටුම් අවම කරගනිමින් නිශ්චිත සාමයක් ගොඩනැගීම සඳහා දේශපාලන නායකත්වයට සෘජුව කාර්යභාරයක් පැවරී ඇත. රටක ආගමික ගැටුම් ඇතුලු උද්ගතවන්නා වූ සියලුම ආකාරයේ අර්බුදයන් මැඩපැවැත්වීම සඳහා නිත්‍යානුකූල රාමුව සකසමින් එය බලාත්මක කිරීම සඳහා ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ දේශපාලන නායකත්වයටය. නමුත් නූතන ලාංකික දේශපාලන සන්දර්භය තුළ දැකිය හැකි ප්‍රවණතාවයක් වන්නේ දේශපාලන නායකත්වය වෙනස් ආකාරයේ න්‍යාය පත්‍රයන් තුළ හිඳිමින් කටයුතු කරනු ලැබීමයි. කලින් කලට පැමිණෙනු ලබන පාලන තන්ත්‍රයන් හි ක්‍රියාකාරිත්වය ද ආගමික ගැටුම් වර්ධනය වීම සඳහා සෘජුව බලපෑම්කර ඇත. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස ශ්‍රී ලංකාවේ ජාතීන් අතර සහයෝගීතාවය සුරක්ෂිත කරමින් ආගමික ගැටුම් නිරාකරණය, සාමය ගොඩනැගීම සඳහා බෞද්ධ ආගමික හා දේශපාලන නායකත්වයට ප්‍රබල බලපෑමක් කළ හැකි වුවත් එය පසුගාමී තත්ත්වයට පත්ව ඇත්තේ ඇයි? යන්න ලෙස සකසා මෙම අධ්‍යයනය සිදුකරන ලදි. එමෙන්ම මෙම පර්යේෂණයේ අරමුණු ලෙසට ආගමික ගැටුම් නිරාකරණය කිරීම සඳහා බෞද්ධ

ආගමික හා දේශපාලන නායකත්වයේ කාර්යභාරය අධ්‍යයනය කිරීම, ලංකාවේ පවත්නා ආගමික ගැටුම් ඇතිවීම කෙරෙහි බලපෑම් කරනු ලබන හේතු සාධක විමසීම, ආගමික ගැටුම් නිරාකරණය කිරීමෙහි පවත්නා නිත්‍යානුකූල පැතිමානයක් විමර්ෂනය කිරීම යනාදිය දැක්විය හැක. තවද, මෙම පර්යේෂණය විෂයානුබද්ධ, පර්යේෂණාත්මක හා කාලීන වශයෙන් වැදගත් වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත භාවිතා කරන ලදි. ප්‍රාථමික දත්ත එක්රැස්කිරීමේදී බහුත්වවාදී ප්‍රවේශයක් මත අධ්‍යයන නියැඳිය සඳහා විවිධ ආගම් නියෝජනය වන පරිදි 100කින් යුත් දත්තදායකයින් පිරිසක් යොදාගනිමින් ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡාවන් මත පදනම් වෙමින් දත්ත රැස්කරගන්නා ලදි. ද්විතියික දත්ත එක්රැස්කිරීමේදී ග්‍රන්ථ, පුවත්පත්, සගරා හා අන්තර්ජාල ලිපි පරිශීලනය කරන ලදි. ප්‍රශ්නාවලිය, සම්මුඛ සාකච්ඡා මගින් හා ද්විතියික දත්ත මූලාශ්‍ර මගින් ලබාග න්නා ලද තොරතුරු ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් විශ්ලේෂණයට ලක්කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

බෞද්ධ ආගමික නායක ස්වාමීන් වහන්සේලා දේශපාලනික වශයෙන් මතවාදී සට්ටනයක සිටීම නිසා ගැටුම් නිරාකරණය කොට සාමය ගොඩනැංවීමේ කර්තව්‍ය මගහැරී ඇත. එමෙන්ම, බෞද්ධ ආගමික නායකත්වයේ උපදේශයන් දේශපාලන නායකයන් විසින් නොතැකීම නිසා නව ආරයේ ආගමික ගැටුම් නිර්මාණය වීමක් දැකිය හැක. තවද, විවිධ ආගමික අන්තවාදී සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය කෙරෙහි ප්‍රතිචාර දක්වන්නට යාමේදී භික්ෂූන් වහන්සේලා ද අරගලකාරී ස්වරූපයකින් යුක්ත වීම නිසා සාමය ගොඩනැංවීමට බාධා එල්ල වී ඇත. ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නිගමනයකර දැක්විය හැකි ප්‍රධාන කාරණාවක් වන්නේ ලංකාවේ දේශපාලන සංස්කෘතියේ නොදියුණු බවයි එනම්,

ආගමික හා දේශපාලන නායකත්වයේ කාර්යභාරය අධ්‍යයනය කිරීම, ලංකාවේ පවත්නා ආගමික ගැටුම් ඇතිවීම කෙරෙහි බලපෑම් කරනු ලබන හේතු සාධක විමසීම, ආගමික ගැටුම් නිරාකරණය කිරීමෙහි පවත්නා නිත්‍යානුකූල පැතිමානයක් විමර්ෂනය කිරීම යනාදිය දැක්විය හැක. තවද, මෙම පර්යේෂණය විෂයානුබද්ධ, පර්යේෂණාත්මක හා කාලීන වශයෙන් වැදගත් වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත භාවිතා කරන ලදි. ප්‍රාථමික දත්ත එක්රැස්කිරීමේදී බහුත්වවාදී ප්‍රවේශයක් මත අධ්‍යයන නියැදිය සඳහා විවිධ ආගම් නියෝජනය වන පරිදි 100කින් යුත් දත්තදායකයින් පිරිසක් යොදාගනිමින් ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡාවන් මත පදනම් වෙමින් දත්ත රැස්කරගන්නා ලදි. ද්විතියික දත්ත එක්රැස්කිරීමේදී ග්‍රන්ථ, පුවත්පත්, සගරා හා අන්තර්ජාල ලිපි පරිශීලනය කරන ලදි. ප්‍රශ්නාවලිය, සම්මුඛ සාකච්ඡා මගින් හා ද්විතියික දත්ත මූලාශ්‍ර මගින් ලබාගන්නා ලද තොරතුරු ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් විශ්ලේෂණයට ලක්කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

බෞද්ධ ආගමික නායක ස්වාමීන් වහන්සේලා දේශපාලනික වශයෙන් මතවාදී සට්ටනයක සිටීම නිසා ගැටුම් නිරාකරණය කොට සාමය ගොඩනැංවීමේ කර්තව්‍ය මගහැරී ඇත. එමෙන්ම, බෞද්ධ ආගමික නායකත්වයේ උපදේශයන් දේශපාලන නායකයන් විසින් නොතැකීම නිසා නව ආරයේ ආගමික ගැටුම් නිර්මාණය වීමක් දැකිය හැක. තවද, විවිධ ආගමික අන්තවාදී සංවිධානයන්හි ක්‍රියාකාරිත්වය කෙරෙහි ප්‍රතිචාර දක්වන්නට යාමේදී භික්ෂූන් වහන්සේලා ද අරගලකාරී ස්වරූපයකින් යුක්ත වීම නිසා සාමය ගොඩනැංවීමට බාධා එල්ල වී ඇත. ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නිගමනයකර දැක්විය හැකි ප්‍රධාන කාරණාවක් වන්නේ ලංකාවේ දේශපාලන සංස්කෘතියේ නොදියුණු බවයි එනම්,

දේශපාලන නායකයන් ආගමික ගැටුම්වලට විසඳුම් සෙවීමේදී ජාතික අභිලාශයන් සැලකිල්ලට නොගෙන තම පෞද්ගලික අභිලාශයන් කේන්ද්‍ර කරගනිමින් කටයුතු කිරීම නිසා ගැටුම් මෝරායමින් උඩුදුවා යාමක් දැකිය හැක. මෙම තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා ලාංකේය දේශපාලන ක්ෂේත්‍රය තුළ මෙන්ම ආගමික ක්ෂේත්‍රය තුළ සිටින්නා වූ සියලුම නායකත්වයන් තමා කෙරෙහි වගකීම පවරා ගනිමින් ක්‍රියාකළ යුතුය. ඒ අනුව මෙහිදී යෝජනා කළ යුතුව ඇති ප්‍රධාන යෝජනාවන් කිහිපයකි. එනම්, ව්‍යවස්ථාව තුළින් බෞද්ධ ආගම විෂයෙහි ලබාදී ඇති ස්ථානය තවදුරටත් සුරක්ෂිත කිරීම, ආගමික සහජීවනය ගොඩනැංවීම පිණිස නිශ්චිත වැඩසටහන් මාලාවක් ප්‍රාදේශීය මට්ටමන් මෙන්ම ජාතික ටම්මටමින් රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කිරීම. සුලු ජාතින්ගේ මෙන්ම මහ ජාතීන්ගේ ආගමික නිදහස හා චින්තනය කෙරෙහි බලපෑම් එල්ලවන ක්‍රියාකාරකම් අහෝසිකිරීම, ආගමික අන්තවාදී සංවිධාන මෙන්ම ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයන් තහනම් කිරීම. ලංකාවේ දේශපාලන සංස්කෘතිය වර්ධනය කිරීම උදෙසා රාජ්‍ය අනුග්‍රහය යටතේ වැඩසටහන් දියත් කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ

Damien Keown, Buddhist Approach to political conflict and peace development UNDV Conference Volume, 2009, learning from religious Peacemakers, p4.

Gair, J. W., & Carter, J. R. (1983). Religiousness in Sri Lanka. Buddhist-Christian Studies, 3, 168.

Peace and change, Volume 2

Schonthal, B. (2016). Buddhism, Politics and the Limits of Law.

Schonthal, B. (n.d.). Constitutional Conversions. Buddhism, Politics and the Limits of Law, 217-260.

www.buildingpece.org

# 13th International Conference on Pali and Buddhist Studies *(ICPBS) -2017*

This is to certify that

Rev/Mr./Ms.
**එච්. ඊ. එන්. ප්‍රියදර්ශනී**

presented a paper on

**ශ්‍රී ලංකාවේ ආගමික ගැටුම් නිරාකරණය, සාමය ගොඩනැගීම සදහා බෞද්ධ ආගමික හා දේශපාලන නායකත්වයේ කාර්යභාරය පිළිබද අධ්‍යයනයක්**

at the above Conference held on 06th December 2017
Organized by

**The Department of Pali and Buddhist Studies**

Faculty of Humanities and Social Sciences

University of Sri Jayewardenepura, Sri Lanka

...................................
Conference Chair
Dr. M.D.D.I Gunathilaka

...................................
Conference Secretary
Dr. A.M.N.W. Mendis